සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2hours

## Christianity– I
ක්‍රිස්තියානි ධර්මය – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. මෙලොව දක්නට ඇති විශ්මිත නිර්මාණය,
   (1) සදාතනික ජීවනය අහිමි වීම (2) පරිසරණකයයි
   (3) පුදුම හතය (4) මිනිසා ය

2. මනුෂ්‍යයා පාපය වැලඳගැනීමේ ප්‍රතිඵලයකි,
   (1) සදාතන ජීවනය අහිමි වීම (2) යහපත තෝරා ගැනීම
   (3) මරණයට පත්වීම (4) දෙවියන් වහන්සේට සමාන වීම

3. කානාන් දේශ සීමාවට පැමිණෙන තෙක් ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ විසින් පෝෂණය කල කාල සීමාව,
   (1) අවු. 20 කි (2) අවු. 30 කි (3) අවු. 40 කි (4) අවු. 25 කි

4. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයකු තුල නොතිබිය යුතු ගුණාංගයක් වන්නේ,
   (1) එකිනෙකාට කමා වීම (2) උදව් කිරීම
   (3) එකිනෙකාට ප්‍රේම කිරීම (4) තරඟය

5. දේව කැඳවීම ලැබීම සඳහා අදාල නොවන දෙයකි,
   (1) දේව හඬට සවන් දීම
   (2) යාච්ඤාවෙන් සවිමත් වීම
   (3) තරාතිරම, පසුබිම හා සමාජ තත්ත්වය
   (4) ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වීම

6. ජේසුස් වහන්සේගේ ප්‍රකාශනයන් අනුව දේව රාජ්‍ය හිමි වන්නේ කාට ද?
   (1) මහල්ලන්ට (2) තරුණ තරුණියන්ට
   (3) කුඩා දරුවන්ට (4) අසරණයන්ට

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

7. මනුෂ්‍යයා දේව මැවිල්ලේ භාරකරු ලෙස ක්‍රියා කළ විට නොකල යුතු දෙයකි,
   (1) දේව ගුණාංග වර්ධනය කර ගැනීම
   (2) දේව ප්‍රේමය අන්‍යයන් වෙත පැතිරවීම
   (3) අපට දී ඇති සම්පත් නාස්ති කිරීම
   (4) අපට දී ඇති නිදහස යුතු ලෙස භාවිතා කිරීම

8. මනුෂ්‍යයාගේ පරිපූර්ණ වර්ධනය උදෙසා දෙවියන් වහන්සේ තැබුවේ,
   (1) හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස ය
   (2) ජීවන වෘක්ෂය ය
   (3) ප්‍රනීත ඵල ලබාදෙන ගස ය
   (4) අලංකාර ගස්වැල් ය

9. වහල් බැම්වලින් මිදීමට නම් අප තුල තිබිය යුත්තේ,
   (1) මිල මුදල් ය (2) කීර්තියයි
   (3) ලෞකික සම්පත් ය (4) අපගේ කැමැත්ත හා කැපවීමයි

10. ''සදාතන ජීවනය'' මිනිසා විසින් අහිමි කරගත්තේ,
   (1) දේව ගරුබිය දැක්වූ නිසා ය
   (2) යටහත්කමින් ජීවත් වූ නිසා ය
   (3) පාපය තෝරාගත් නිසා ය
   (4) කීකරුකම දැක්වූ නිසා ය

11. ''ප්‍රේරිතයන් '' ලෙස තෝරාගත්තවුන් අතරින් අයකැමියෙකු වූයේ,
   (1) යොහාන් ය (2) මතෙව් ය
   (3) සීමොන් පේදුරු ය (4) තෝමස් ය

12. ප්‍රථමයෙන් ධර්මදූත මෙහෙවරට යොමුකරනු ලැබුවේ,
   (1) විජාතිකයන්ටය (2) ඊශ්‍රායෙල්වරුන්ට ය
   (3) ජුදෙව්වන්ට ය (4) සමාජිකයන්ට ය

13. ''තහනම් ගසේ ගෙඩි'' සංකේතවත් කළේ,
   (1) මනුෂ්‍යන්ගේ පැවැත්ම ය (2) නපුර ය
   (3) පාපයයි (4) නිදහස ය

14. ඊශ්‍රායෙල් ජනතාව වහල්බවින් මුදාගැනීම සඳහා දෙවියන් වහන්සේ තෝරාගත්තේ,
   (1) ජොසෙප් ය (2) මෝසෙස් ය
   (3) ආබ්‍රහම් ය (4) ආරොන් ය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

15. අපගේ ජීවිත ගමනේදී දුක් කම්කටොළු පැමිණෙන විට අප කළ යුත්තේ,

(1) අවලාද නැගීම ය (2) මැසිවිලි කීමය
(3) කෙඳරිගෑමය (4) විශ්වාසයෙන් සිටීම ය

16. ''මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත'' යනුවෙන් පවසා ජේසුස් වහන්සේ සිය මෙහෙවර උදෙසා කැඳවූ ප්‍රේරිතයා,

(1) යොහාන් ය (2) යාකොබ් ය
(3) සීමොන් ය (4) මතෙව් ය

17. ජේසුස් වහන්සේ මෙහෙවර හා සම්බන්ධ දිවැස්වැකිය ලියවී ඇත්තේ,

(1) ජෙරමියා පොතෙහි ය (2) යෙසායා පොතෙහීය
(3) මීකා පොතෙහීය (4) නෙහෙමියා පොතෙහීය

18. දේව රාජ්‍යයේ පණිවුඩය නොපිළිගන්නා අය ඉදිරියේ පාදවල දූවිලි ගසා දැමීම සංකේතවත් කළේ,

(1) දේව අනුග්‍රහයයි (2) දයා කරුණාවයි
(3) පැමිණෙන දේව විනිශ්චයයි (4) බලයයි

19. යහපත් බැටළු එඬේරකුගේ පිළිවෙතක් නොවන්නේ,

(1) රැළට පෝෂණය සලසා දීම ය
(2) රැකවරණය සලසා දීම ය
(3) නැතිවූ බැටළුවන් අත්හැර දැමීම ය
(4) අතරමං වූ බැටළුවන් මුදාගැනීම ය

20. ජේසුස් වහන්සේ හැදී වැඩුණු නුවර වූයේ,

(1) බෙත්ලෙහෙම (2) ජෙරුසලම
(3) නාසරෙත් (4) ගලීලය

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07**
රාජකීය විද්‍යාලය - කොළඹ 07
**Grade 8 – First Term Test – April 2019**
**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය**

# Christianity – II
# ක්‍රිස්තියානි ධර්මය – II

Name :- ................................................... Grade : -................ Index number:-....................

## II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

1. (i) ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගෙන් අපේක්ෂා කල ප්‍රධාන මෙහෙවර කුමක් ද?
   (ii) ජේසුස්වහන්සේගේ මෙහෙවරට අදාල අරමුණු ප්‍රකාශ කලේ කුමන දේශනයෙන් ද?
   (iii) ජේසුස් වහන්සේ ධර්මදූත සේවයේදී ගෝලයන්ට පැවරූ කාර්යයන් 2ක් ලියන්න.
   (iv) ජේසුස් වහන්සේ ගෝලයන්ට කැඳවීම දුන්නේ කොහේදී ද?
   (v) කලින් බැටළු එඬේරකු ලෙස දිවි ගෙවූ රජතුමා කවුද?
   (vi) ඉශ්‍රායෙල්වරු වහල්කමේ සිටියේ කොහේ ද?
   (vii) ඉශ්‍රායෙල් සෙනඟට රජතුමා පීඩා කිරීමට හේතුව කුමක් ද?
   (viii) අද අපි බැඳී ඇති වහල්කම් 3ක් ලියන්න.
   (ix) පහත සඳහන් ඒවායින් සංකේතවත් වන්නේ කුමක් දැයි ලියන්න.
   සර්පයා -
   හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස -
   (x) දේව මැවිල්ල සම්බන්ධව මනුෂ්‍යයාට පැවරූ වගකීම් 2ක් ලියන්න. (2 x 10 =20)

2. යහපත් බැටළු එඬේරා,
   (i) කිතුනුවන්ට යහපත් බැටළු එඬේරා වන්නේ කවුරුන් ද? (2)
   (ii) බැටළු එඬේරෙකුගේ කාර්යයන් 3ක් ලියන්න. (3)
   (iii) අප ජීවත් වන සමාජය තුල කිතුනු අප එඬේරික සේවය ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? (5)

3. '' මා අනුව එන්න''
   (i) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කා හට ද? (2)
   (ii) මෙසේ කැඳවීම ලැබූ තැනැත්තා ප්‍රතිචාර දැක්වූයේ කෙසේදැයි යන්න කෙටියෙන් විස්තර කරන්න. (3)
   (iii) දේව පියාගෙන් කිතුනු අපට ලැබෙන කැඳවීම් වලට අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේ ද? (5)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. නාසරෙත්හී දේශනය,

(i) මෙම දේශනයට අදාළ බයිබල් පාඨය උපුටා ගනු ලැබූ බයිබලීය පොත කුමක් ද? (2)

(ii) ජේසුස් වහන්සේ තෝරාගත් බයිබල් කොටසට අදාළ සමාජ කොටස් 3ක් නම් කරන්න. (3)

(iii) පහත සඳහන් සමාජ කොටස් වර්තමාන සමාජයට ගැලපෙන ලෙස කෙටියෙන් හඳුන්වන්න.

- දිළින්දන්
- වහලුන්
- අන්ධයින්
- පීඩිතවූවන් (5)

5. වහල්කමේ සිටි ඉශ්‍රායෙල් සෙනඟ,

(i) ඉශ්‍රායෙල් සෙනඟ වහල්කමේ සිටි අවධියේ රජකම් කළේ කවුද? (2)

(ii) ඉශ්‍රායෙල් සෙනඟ විඳි පීඩා 3ක් ලියන්න. (3)

(iii) අද අපි බැඳි ඇති වහල් බැමි වලින් මිදීමට ගත හැකි පියවර කීපයක් ලියන්න. (5)

6. දේවපියා මනුෂ්‍යයා කෙරෙහි දක්වූ අසීමිත ප්‍රේමය,

(i) මිනිසා ජීවය ලැබුවේ කෙසේ ද? (2)

(ii) පාපයට වැටෙන මනුෂ්‍යාට හිමි වන්නේ හා අහිමි වන්නේ මොනවා ද? (3)

(iii) පාපය වැළඳ ගන්නා මනුෂ්‍යා ක්‍රියා කරන්නේ කෙසේ ද? (5)